අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

**මෙම අධිකාරියේ පුරප්පාඩුව පවත්නා පහත සඳහන් තනතුරු සඳහා අදාල සුදුසුකම් සපුරන, කුසලතා පූර්ණ, කාර්යශූර, විශිෂ්ට චරිතයකින් හෙබි ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

| | තනතුරු නාමය | සේවා ගණය, වැටුප හා වයස් සීමාව | සපුරාලිය යුතු සුදුසුකම් |
|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ<br>(මානව සම්පත් හා පරිපාලන) | <u>සේවා ගණය</u><br>ජ්‍යෙෂ්ඨ කළමනාකාර (HM 1-1)<br><br><u>වැටුප් ක්‍රමය:</u><br>**<u>(චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛණ 01 අනුව 2027.01.01 දින සිට)</u>**<br>රු.140,640-15x4,100 – 202,140 හා රජයේ අනුමත අනෙකුත් දීමනා<br>**<u>2025.01.01 දින සිට වැටුප් පියවර</u>**<br>රු: 123,019.00<br><br><u>වයස් සීමාව</u><br>අවුරුදු 35 ට නොඅඩු හා වයස 55 ට නොවැඩි | <u>බාහිර අයදුම්කරුවන්</u><br>**01.** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.<br>සමඟ<br>අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.<br>සහ<br>රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර"මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) පළපුරුද්දක් ලබා තිබීම.<br><u>අභ්‍යන්තර අයදුම්කරුවන්</u><br>**01.** ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.<br>හෝ<br>**02.** ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ අදාල විෂය ක්ෂේත්‍රයේ "කලමනාකරණ" සේවා ගණයෙහි (MM 1-1) පළමුවන ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |
| 02 | සහකාර අධ්‍යක්ෂ<br>(දිස්ත්‍රික්) | <u>සේවා ගණය</u><br>කළමනාකාර (MM 1-1)<br><br><u>වැටුප් ක්‍රමය:</u><br>**<u>(චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛණ 01 අනුව 2027.01.01 දින සිට)</u>**<br>රු.91,690 - 10x2,480 – 15 x 3,450 – 168,240 හා රජයේ අනුමත අනෙකුත් දීමනා<br><br>**<u>2026.01.01 දින සිට වැටුප් පියවර</u>**<br>රු: 81,710.00 හා රජයේ අනුමත අනෙකුත් දීමනා<br><br><u>වයස් සීමාව</u><br>අවුරුදු 22 ට නොඅඩු හා වයස 45 ට නොවැඩි | <u>බාහිර අයදුම්කරුවන්</u><br>**01.** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඉංජිනේරු හෝ ක්ෂේත්‍රයට අදාළ වෙනත් විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.<br>සහ<br>උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.<br>හෝ<br>**02.** තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාමරීක/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ ) හත්වැනි (07) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.<br>සහ<br>එම සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.<br>හෝ<br>**03.** අදාළ ක්ෂේත්‍රයේ ජාතික තාක්ෂණික ඩිප්ලෝමා (NDT)/ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමා (NDES)/ උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (HNDE) / ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා/ ජාතික වෘත්තීය සුදුසුකම් 6 වන මට්ටම (NVQ Level 6) සහතිකයක් ලබා තිබීම<br>සහ<br>එම සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ වසර හයක (06) සේවා පළපුරුද්දක් ලබා තිබීම.<br><u>අභ්‍යන්තර අයදුම්කරුවන්</u><br>**02** ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.<br>හෝ<br>**01.** "කණිෂ්ඨ කලමනාකාර"(JM 1-1) සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.. |
| 03 | සහකාර අධ්‍යක්ෂ<br>( වෘත්තීය මාගෙර්ාපදේශන, රැකියාගත කිරීම හා ප්‍රවර්ධන) | <u>සේවා ගණය</u><br>කළමනාකාර<br>(MM 1-1)<br><u>වැටුප් ක්‍රමය:</u><br>**<u>(චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛණ 01 අනුව 2027.01.01 දින සිට)</u>**<br>රු.91,690 - 10x2,480 – 15 x 3,450 – 168,240 හා රජයේ අනුමත අනෙකුත් දීමනා<br>**<u>2026.01.01 දින සිට වැටුප් පියවර</u>**<br>රු: 81,710.00 හා රජයේ අනුමත අනෙකුත් දීමනා<br><u>වයස් සීමාව</u><br>අවුරුදු 22 ට නොඅඩු හා වයස 45 ට නොවැඩි | <u>බාහිර අයදුම්කරුවන්</u><br>**01.** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.<br>සහ<br>උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම<br><br><u>අභ්‍යන්තර අයදුම්කරුවන්</u><br>**03** ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.<br>හෝ<br>**02.** "කණිෂ්ඨ කලමනාකාර"(JM 1-1) සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.. |
| 04 | පුහුණු නිලධාරි | <u>සේවා ගණය</u><br>කණිෂ්ඨ කළමනාකාර (JM 1-1)<br><br><u>වැටුප් ක්‍රමය:</u><br>**<u>(චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛණ 01 අනුව 2027.01.01 දින සිට)</u>**<br>රු.72,650 - 10x1,360 – 18 x 2,040 – 122,970 හා රජයේ අනුමත අනෙකුත් දීමනා.<br><br>**<u>2026.01.01 දින සිට වැටුප් පියවර</u>**<br>රු: 65,633.00 හා රජයේ අනුමත අනෙකුත් දීමනා<br><br><u>වයස් සීමාව</u> | <u>බාහිර අයදුම්කරුවන්</u><br>**01.** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ක්ෂේත්‍රයට අදාළ විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.<br>හෝ<br>**02.** තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාමරීක/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ ) හත්වැනි (07) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.<br>හෝ<br>**03.** අදාළ ක්ෂේත්‍රයේ ජාතික තාක්ෂණික ඩිප්ලෝමා (NDT)/ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමා (NDES)/ උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (HNDE) /ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා /ජාතික වෘත්තීය කුසලතා (NVQ ) හයවැනි (06) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.<br>සහ<br>එම සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහක (05) පළපුරුද්දක් ලබා තිබීම. |

| | | | |
|---|---|---|---|
| | | අවුරුදු 22 ට නොඅඩු හා වයස 45 ට නොවැඩි | හෝ<br>**04.** තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාමරීක/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ ) පස්වැනි (05) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.<br>සහ<br>එම සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහයක (10) පළපුරුද්දක් ලබා තිබීම.<br><br>**<u>අභ්‍යන්තර අයදුම්කරුවන්</u>**<br>**01.** ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම<br>හෝ<br>**02.** "ක්‍රියාත්මක කිරීමේ / උපදේශන සේවාවන්" (MA 4) සේවා ගණයේ ජ්‍යෙෂ්ඨ උපදේශක තනතුරේ වසර පහක (05) සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.<br>හෝ<br>"කලමනාකරණ සහකාර - තාක්ෂණ" (MA 2-2) සේවා ගණයේ II වන ශ්‍රේණියේ උපදේශක තනතුරෙහි අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |
| 05 | වැඩසටහන් නිලධාරි | **<u>සේවා ගණය</u>**<br>ක්‍රියාත්මක කිරීමේ / උපදේශන සේවාවන් (MA 4)<br><br>**<u>වැටුප් ක්‍රමය:</u>**<br>**<u>(චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛණ 01 අනුව 2027.01.01 දින සිට)</u>**<br>රු.64,320 - 10x1,360 – 15 x 1,670 - 5x2,040 – 113,170 හා රජයේ අනුමත අනෙකුත් දීමනා<br><br>**<u>2026.01.01 දින සිට වැටුප් පියවර</u>**<br>රු: 58,598.00 හා රජයේ අනුමත අනෙකුත් දීමනා<br><br>**<u>වයස් සීමාව</u>**<br>අවුරුදු 22 ට නොඅඩු හා වයස 45 ට නොවැඩි | **<u>බාහිර අයදුම්කරුවන්</u>**<br>**01.** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.<br><br>**<u>අභ්‍යන්තර අයදුම්කරුවන්</u>**<br>**01.** ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.<br>හෝ<br>**02.** "කලමනාකරණ සහකාර - තාක්ෂණික නොවන" (MA 1-2) සේවා ගණයේ තනතුරක අවම වශයෙන් වසර අටක (08) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |
| 06 | සැළසුම් ශිල්පී (කොන්ත්‍රාත් පදනම මත) | **<u>සේවා ගණය</u>**<br>කලමනාකරණ සහකාර (තාක්ෂණ) (MA 2-2)<br><br>**<u>මාසික දීමනාව</u>**<br>රු.43,379.00 හා රජයේ අනුමත අනෙකුත් දීමනා<br><br>**<u>වයස් සීමාව</u>**<br>අවුරුදු 18 ට නොඅඩු හා වයස 45 ට නොවැඩි | **01.** එක් එක් තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාමරීක/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.<br><br><u>තනතුරට විශේෂිත වෙනත් සුදුසුකම්.</u><br>අදාළ ක්ෂේත්‍රයේ එක් වසරක (01) සේවා පලපුරුද්දක් ලබා තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ. |
| 07 | කළමනාකරණ සහකාර | **<u>සේවා ගණය</u>**<br>කලමනාකරණ සහකාර (තාක්ෂණ නොවන) (MA 1-2)<br><br>**<u>වැටුප් ක්‍රමය (චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛණ 01</u>**<br>රු.46,220 - 10x540 – 7x630 – 12x1,080 - 12x1,280 – 84,350 හා රජයේ අනුමත දීමනා<br><br>**<u>අනුව 2026.01.01 දින සිට</u>**<br>රු.43,312.00 හා රජයේ අනුමත අනෙකුත් දීමනා<br><br>**<u>වයස් සීමාව</u>**<br>අවුරුදු 18 ට නොඅඩු හා වයස 45 ට නොවැඩි | **<u>බාහිර අයදුම්කරුවන්</u>**<br>**01.** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී,<br>• සිංහල/ දෙමළ<br>• ගණිතය<br>යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04)කට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.<br>**02.** අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.<br><br>**<u>අභ්‍යන්තර අයදුම්කරුවන්</u>**<br>01. ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයෙහි පහත 'ආ', 'ඇ' සහ 'ඉ' සඳහන් සුදුසුකම් ඇති නිලධාරීන්ට මේ සඳහා අයදුම් කල හැකිය.<br>ආ. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී<br>• සිංහල/ දෙමළ<br>• ගණිතය<br>යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.<br>ඇ. පරිගණක දැනුම පිළිබඳ සහතික පත්‍ර මට්ටමේ සහතිකයක් ලබා තිබීම.<br>ඇ. සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.<br>ඉ. නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.<br>සටහන් :- (I) යම් තනතුරකට ස්ථිරව පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තා වූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තා වූ පුහුණුවීමේ කාල පරිච්ඡේදයක් ඉහත "ඉ" ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ. යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික/ අනියම් සේවා කාල පරිච්ඡේද ඉහත "ඉ" ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ. |

**සැ.යු:**

❖ ඉහත තනතුරු සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තයන්ගේ භාර කාර අරමුදලට හිමිකම් සහිතය.

- අදාළ අයදුම් පත්‍රය ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ වෙබ් පිටුවෙන් www.vtasl.gov.lk භාගත කරගත යුතුය.
- රජයේ/රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනයන්හි සේවයේ නියුතුවූවන් සඳහා ඉහත වයස් සීමාවන් අදාළ නොවේ.
- එක් තනතුරකට වඩා වැඩි ගණනකට අයදුම් කරන්නේ නම්, ඒ ඒ තනතුර සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පත් යොමු කල යුතුය.
- අදාළ අයදුම්පත් **2026 අගෝස්තු මස 03 දින** හෝ ඊට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් යොමු කල යුතුය. පරිපාලන ගාස්තු ලෙස නාරාහේන්පිට මහජන බැංකු ශාඛාවේ අංක 119-1-001-9-3693223 දරණ ගිණුමට ("Admin Fee" ලෙස සඳහන් කර) රු.1000/= ක මුදලක් බැරකර , එම රිසිට් පත අයදුම් පත්‍රයට අමුණා එවිය යුතුය.
- අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහල කෙළවරේ **අයදුම් කරන තනතුර** සඳහන් කර එවිය යුතුය. අසම්පූණර්, අදාල සුදුසුකම් සපුරා නොමැති හෝ ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි විවෘත ලිඛිත තරඟ විභාගයකින් හා / හෝ පත්වීම් බලධාරියා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගනු ලැබේ. බඳවා ගැනීමේදී ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සභාපති/ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.
- තෝරා ගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය විසින් තීරණය කරනු ලබන යම් කාලසීමාවක් මෙම අධිකාරියේ සේවා අවශ්‍යතාවය මත අනුයුක්ත කරනු ලබන පළාතේ/දිස්ත්‍රික්කයේ අනිවාර්යයෙන්ම සේවය කිරීමට මෙම අධිකාරිය සමඟ ගිවිසුම්ගත විය යුතුය. කෙසේ වුවද මෙම අධිකාරියේ අවශ්‍යතාවයන් මත අනුයුක්ත කරනු ලබන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ඕනෑම සේවා ස්ථානයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

සභාපති/ප්‍රධාන විධායක නිළධාරී,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය,
"නිපුණතා පියස", 04 වැනි මහල, අංක 354/2, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.
දු.ක.අංක - 0112-596516/17

*- ජීවිතයට හැකියාවක් හැකියාවට රැකියාවක් -*